**විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්**

**පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

**மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்**

**PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE**

No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya


| මගේ අංකය / எனது இல. / My Ref. | WPC/PSC/REC01/2023 | ඔබේ අංකය / உமது இல. / Your Ref. | | දිනය / திகதி / Date | 2023.11.30 |
|---|---|---|---|---|---|

ප්‍රධාන ලේකම්, (බ.ප.)

ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.),

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.),

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I/III සහකාර අධ්‍යක්ෂ , පරිවාස නිලධාරී II සහ පුස්තකාලයාධිපති III තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය 2023**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I/III සහකාර අධ්‍යක්ෂ, පරිවාස නිලධාරී II සහ පුස්තකාලයාධිපති III සේවයේ තනතුරු වලට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය සඳහා පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ඒ අනුව අදාල අයදුම්පත් 2023.12.10 දිනට පෙර මාර්ගගතව සම්පූර්ණ කර 2023.12.13 දින හෝ එදිනට පෙර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි. (අයදුම්පත් කැඳවීමේ නිවේදනය හා ආදර්ශ අයදුම්පත මේ සමග අමුණා ඇත)

03. මෙම අයදුම්පත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk මඟින් බාගත කර ගත හැක.

තිලක් සෙනරත් ,
ලේකම් ,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත


| ලේකම් / செயலாளர் / Secretary | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති) / உதவிச் செயலாளர் / Assistant Secretary (Management & Policies) | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්) / உதவிச் செயலாளர் / Assistant Secretary (Examinations & Recruitment) | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) / உதவிச் செயலாளர் / Assistant Secretary (Establishment & Accounts) | පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614; ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512; ඊ-මේල් / மின்னஞ்சல்: ppscwpsc@sltnet.lk |
|---|---|---|---|---|---|
| 011 2879528 | [illegible] | 011 2879317 | 011 2879528 | [illegible] | |

විශිෂ්ට පරමාදර්ශී අභිමානවත් පළාත් රාජ්‍ය සේවයක්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත
மாகாண அரசாங்க சேவை ஆணைக்குழு - மேல் மாகாணம்
PROVINCIAL PUBLIC SERVICE COMMISSION - WESTERN PROVINCE

අංක 628,10 වන මහල,ජන ජය සිටි ගොඩනැගිල්ල,නාවල පාර,රාජගිරිය இல.628, 10 வது மாடி, ஜன ஜய சிட்டி வளாகம், நாவல வீதி, ராஜகிரிய No.628,10th Floor, Jana Jaya City Building, Nawala Road, Rajagiriya

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | WPC/PSC/REC01/2023 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2023.12.08 |

ප්‍රධාන ලේකම්, (බ.ප.)

ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප.),

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප.),

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I/III සහකාර අධ්‍යක්ෂ , පරිවාස නිලධාරී II සහ පුස්තකාලයාධිපති III තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය 2023 - අයදුම් පත් කැඳවීමේ අවසන් දිනය දීර්ඝ කිරීම</u>-**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I/III සහකාර අධ්‍යක්ෂ, පරිවාස නිලධාරී II සහ පුස්තකාලයාධිපති III සේවයේ තනතුරු වලට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය සම්බන්ධයෙන් යොමු කළ මාගේ සමාංක හා 2023.11.30 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

02. ඒ අනුව අයදුම් පත් කැඳවීමේ අවසන් දිනය 2023.12.15 දක්වා දින දීර්ඝ කරන ලද බව කාරුණිකව දන්වමි.අදාල අයදුම්පත් වල මුද්‍රිත පිටපත් **2023.12.15** දින හෝ එදිනට පෙර බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත එවීමට කටයුතු කරන මෙන් දන්වා සිටින අතර මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු <u>නොකරන</u> මෙන් වැඩි දුරටත් දන්වමි.

තිලක් සෙනරත් ,
ලේකම් ,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත



| ලේකම්<br>செயலாளர்<br>Secretary<br>011 2879528 | සහකාර ලේකම් (කළමනාකරණ හා ප්‍රතිපත්ති)<br>உதவிச் செயலாளர் (நிர்வாகம் மற்றும் கொள்கைகள்)<br>Assistant Secretary (Management & Policies)<br>011 2879610 | සහකාර ලේකම් (විභාග හා බඳවාගැනීම්)<br>உதவிச் செயலாளர் (பரீட்சைகள் மற்றும் ஆட்சேர்ப்பு)<br>Assistant Secretary (Examinations & Recruitment)<br>011 2879317 | සහකාර ලේකම් (ආයතන හා ගිණුම්)<br>உதவிச் செயலாளர் (தாபனம் மற்றும் நிதி)<br>Assistant Secretary (Establishment & Accounts)<br>011 2879538 | පරිපාලන නිලධාරී<br>நிர்வாக உத்தியோகத்தர்<br>Administrative Officer<br>011 2879517 | කාර්යාලය / அலுவலகம் / Office: 011 2879614<br>ෆැක්ස් / பெக்ஸ் / Fax: 011 2879512<br>ඊ-මේල් / ஈமெயில் / E-Mail: ppscwpsc@sltnet.lk |
|---|---|---|---|---|---|

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
## බස්නාහිර පළාත් රාජ් සේවයේ පුස්තකාලයාධිපති සේවයේ IIIශ්‍රේණියට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය - 2023

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ III වන ශ්‍රේණියේ (සීමිත) තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, දැනට සේවයේ නියුතු අදාල සුදුසුකම් සපුරා ඇති අයදුම් කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පැවැත්වීමට නියමිත ය.

02 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 30% ක් සීමිත ධාරාව යටතේ ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

03 (අ) පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය හා ඒ සම්බන්ධව අවසාන තීරණය ගැනීමේ බලය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ආ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසි වලට ද, 2021.08.19 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධන වලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2055/13 සහ 2018.01.24 වැනි දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ඇ) සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති සේවයේ 111 ශ්‍රේණියට පත්කරනු ලබන නිලධාරියෙකු එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ය. බස්නාහිර පළාත් පුස්තකාලයාධිපති සේවයේ 111 ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය.

04. රා.ප.ච 3/2016 හි MN-3-2016 අනුව බස්නාහිර පළාත් පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියට අදාල වැටුප් පරිමාණයරු.31040-44510-660x 11-730 x10-750x10-57550 ක් වේ.

05. <u>සුදුසුකම්:</u>

(i) (අ) බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පුස්තකාල සහකාර තනතුරේ වසර 05 ක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම

හෝ

ප්‍රාථමික සේවා ගණයේ තනතුරක ස්ථිර කර ඇති සහ එම තනතුරෙහි වසර 10 ක සක්‍රිය සේවා කාලයක් තිබීම

සහ

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම (මේ සඳහා උපරිම වයස් සීමාව අදාල නොවේ)

සහ

(ආ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයක් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පළමු අදියර සමත්ව තිබීම

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පළමු අදියර සමත්ව තිබීම

හෝ

(ii) (අ) ප්‍රාථමික සේවා ශ්‍රේණියේ තනතුරක ස්ථිර කර ඇති සහ එම තනතුරෙහි වසර පහක (05 ක) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම (මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපවැත්වේ.)

සහ

(ආ) (i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්ව විද්‍යාලයක් ලෙස පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

(ඇ) සෑම අයදුම්කරුවෙකුම තනතුරට බඳවා ගැනීම සඳහා අදාල වන සියළු සුදුසුකම් සෑම ආකාරයකින්ම .................. දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඈ) සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්තවිය යුතුය

06 <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. අයදුම්කරුවෙකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර, විභාගයට නියමිත සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුවේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.

| | විෂයය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1 | පුස්තකාල හා විඥාපන විද්‍යාව | පැය 03 | 100 | 40 % |
| 2 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 % |
| 3 | සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 % |

**ඉහත විෂයයන්ට අදාල 111 ශ්‍රේණිය සීමිත තරඟ විභාගය විෂය නිර්දේශය පහත පරිදි වේ.**

1 පුස්තකාල හා විඥාපන විද්‍යාව

(1) පුස්තකාල හා පුස්තකාලාධිපතිත්වය

(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය

(ආ) පුස්තකාලයන්හි සාමාජීක කාර්යභාරය

(ඇ) පොත් සහ විවිධ ලේඛන හා ලේඛන මුද්‍රිත නොවන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශනය

(ඈ) විද්වත් වෘත්තීය සංගම්
- i ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
- ii ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්

(ඉ) පුස්තකාල වර්ග
- i රජයේ අමාත්‍යංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල
- ii මහජන පුස්තකාල

(ඊ) පුස්තකාල කමිටු

(උ) සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Praservation)

(11) දැනුම හා තොරතුරු සංවිධානය

(අ) ග්‍රන්ථ වර්ගීකරණය එහි අරමුණු හා ප්‍රයෝජන

(ආ) ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග

(ඇ) දශම වර්ගීකරණය

(ඈ) සූචිකරණය,එහි අරමුණු

(ඉ) AACR 2 සූචිකරණ නීති සංග්‍රහය

(ඊ) සංලේඛය හා ග්‍රන්ථ විස්තරය

(උ) සූචි වර්ග

(111) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා

(අ) විවිධ පුස්තකාල සම්පත්

(ආ) පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය

(ඇ) ප්‍රතිග්‍රහණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය

(ඈ) පිරිසැකසුම්කරණය

(ඉ) තොග සමීක්ෂණය හා අපහරණ ක්‍රියාවලිය

(IV) තොරතුරු සන්නිවේදන තාක්ෂණය

(Information Communication Technology)

(අ) පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම්

2 බුද්ධි පරීක්ෂණය

පද සංඛ්‍යා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමේ ලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

3 සාමාන්‍ය දැනුම

ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුල මෙන්ම අප සමාජය තුල පවත්නා සාමාජීයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන්ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

<u>සටහන</u> : පත්වීම සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් සියයට 40 බැගින්වත් (40%) අයදුම්කරුවකු විසින් ලබාගත යුතු වන අතර, සීමිත තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු වල කුසලතා අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් දෙනු ලැබේ.

07 <u>විභාග ගාස්තු</u> :

සෑම අපේක්ෂකයෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු වේ. විභාග ගාස්තුව රු. 1200/- කි. මෙම විභාග ගාස්තුව බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම <u>ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට</u> මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය <u>(බ.ප.01 ලදුපත)</u> අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ <u>බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99</u>

ට බැර වන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

08 **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම :**

අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු/අසත්‍ය තොරතුරු ලබා දී ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු/ඇය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට හැකියාව ඇත.

09 අයදුම්පත්‍ර

මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත පත්‍රය අනුව A4 (සෙ.මී. 21x29) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින්,

(අ) අංක 1 සිට 03දක්වා ඡේදයන් පළමු පිටුවට ද,

(ආ) අංක 04 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද ඇතුළත් වනසේ අයදුම්පත්‍ර පිළියෙළ කරගත යුතුය.

(ඇ) තෝරා ගන්නා අයදුම්කරුවන් වෙත පත්වීම් ලිපි නිකුත් කරනු ලබන්නේ අයදුම්පතේ සටහන් කරනු ලබන මුලකුරු සමඟ නමට පමණක් වන බැවින් අයදුම්පතේ නම නිවැරදිව සටහන් කළයුතුය. පත්වීම් නිකුත් කරනු ලබන අවස්ථාවේ නමෙහි සංශෝධනයන් කිරීමට හෝ යම් කොටස් ඇතුළත් කිරීමට/ඉවත් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

(ඈ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍ර වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය .

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත් සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුවේ. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන අයදුම්පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුණහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

11 **අයදුම්කිරීමේ ක්‍රමය**

නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.12.10 දිනට පෙර මාර්ගගතව සම්පූර්ණ කර 2023.12.13 දින හෝ එදිනට පෙර දිනට හෝ ඊට පෙර **"ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය, අංක 628, 10 වන මහල, ජනපය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය "** යන ලිපිනයට ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරග විභාගය 202.. " යන්න වරහන් තුළ සඳහන් කළ යුතුය. තැපෑලේදී අස්ථානගතවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

12. අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන්

සහා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය

13. <u>විභාගයට ඇතුල්වීම:</u>

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශපත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශපත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරනලද නිතීරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

14. <u>අපේක්ෂකයාගේ අනන්‍යතාවය</u>:

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍ර

15. <u>සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:</u>

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

16. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන් නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තම ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

17. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ .................... නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

18. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය වන / නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

19. මෙම නිවේදනයේ සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය

තිලක් සෙනරත්
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
2023.11.29.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - (2021)

Limited Competitive Examination for Recruitment to Grade III of Western Provincial Librarian Service (2021)

(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ඉංග්‍රීසි - 4

(මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම : ..........................................
උදා : PERERA A.B.C.D (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 සම්පූර්ණ නම : ..........................................

..........................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : ..........................................

..........................................

(සිංහලෙන්/දෙමළෙන්)

2.0 2.1 ස්ථිර ලිපිනය ..........................................

..........................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..........................................

..........................................

(සිංහලෙන්/දෙමළෙන්)

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් ..........................................

..........................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් ..........................................

..........................................

3.0 3.1 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.2 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - ☐ ස්ත්‍රී - ☐ (අදාළ කොටුව තුළ √ යොදන්න)

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය: ☐☐ දිනය : ☐☐

3.4. අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින: ☐☐

3.5 විවාහක / අවිවාහක බව: විවාහක - ☐ අවිවාහක - ☐ (අදාළ කොටුව තුළ √ යොදන්න)

3.5 දුරකථන අංකය ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

3.6 දුරකථන අංකය ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 <u>සේවා විස්තරය</u>

4.1 ඔබ දැනට සේවය කරන ආයතනය;- ..........................................

4.2 එය අයත්වන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව ..........................................

4.3 ඔබගේ පෞද්ගලික ලිපි ගොණුව පවත්වාගෙන යන කාර්යාලයේ නම හා ලිපිනය

.............................................................................................................

.............................................................................................................

4.4 ආයතන ප්‍රධානියාගේ නිල නාමය .............................................................................................

4.5 දැනට දරණ තනතුරේ ස්වභාවය: (අදාල නොවන කොටස් කපා හරින්න)

පුස්තකාල සහකාර /ප්‍රාථමික සේවා ශ්‍රේණිය /ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ශ්‍රේණිය

4.5 දැනට දරණ තනතුරේ පදවි නාමය .............................................................................................

4.6 දැනට දරණ තනතුර ස්ථිර කර තිබේද /එම ස්ථිර කිරීමේ ලිපියේ යොමු අංකය හා දිනය ........................

.............................................................................................................

4.6 දැනට දරණ තනතුරේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය .............................................................

4.7 දැනට දරණ තනතුරේ වැටුප් කේතය (රා.ප.ච. 3/2016 අනුව හා පෞද්ගලික ලිපිගොණුව අනුව සඳහන් කරන්න).............................................................

(PL-1-2016, / PL-2-2016,/ PL-3-2016,/ MN - 1-2016)

4.8 ………………………………දිනට ඉහත 4.5 සඳහන් තනතුරේ සේවා කාලය

5.0 විභාග නිවේදනයේ 6 (ආ) (i),(ii),(iii) ඡේදය ප්‍රකාරව මෙම විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති පුස්තකාල විද්‍යාව සම්බන්ධ ඩිප්ලෝමා පාඨමාලාව/සුදුසුකම පිළිබඳ විස්තර

(i). විශ්ව විද්‍යාලය/ආයතනය :.............................................................................................

(ii) ඩිප්ලෝමාව සමත් අවසාන අදියර:..............................................................

(ii). ඩිප්ලෝමාවඅවසන් කර තිබේනම්වලංගු දිනය: ..............................................................

(iv) වෙනත් සුදුසුකම් :- .............................................................................................

.............................................................................................

(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල වන සහතික/ලේඛන අමුණන්න)

6.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න) ඔව් ☐ නැත ☐

.............................................................................................

.............................................................................................

7.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

i. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය :

.............................................................................................

ii. ලදුපත් අංකය හා දිනය : .............................................................................................

iii. ගෙවූ මුදල : .............................................................................................

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(ලදුපතේ පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.) |
|---|

## 8.0 අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද, මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි,

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි,

(ඇ) තව ද, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සෙකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුර විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි,

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය .......................................... ..........................................................

අයදුම්කරුගේ අත්සන

## 9.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ....................................................................................................

මයා/මිය/මෙනවිය මෙම කාර්යාලයේ සේවය කරන අතර ඔහු/ඇය මා ඉදිරිපිට දී ...................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය .......................................... ..........................................................

අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................................................
තනතුර හා ලිපිනය :
....................................................................................................................................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

සටහන :- තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලය ලත් නිලධාරියෙකු ඉදිරිපිටදී අයදුම්කරු විසින් අත්සන් කල යුතුය

### දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................ මයා/මිය/මෙනවිය ..............................................................................................කාර්යාලයේ/ආයතනයේ ............................ දින සිට මේ දක්වා ...................................................... (තනතුර) වශයෙන් ස්ථිර තනතුරක සේවය කරන අතරඅයදුම්පත් කැඳවන ............................................................................ දිනට

1. එම තනතුර ස්ථිර කර ලිපියක් නිකුත් කර ඇති බවද,
2. බඳවා ගැනීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බවද
3. ඔහු/ඇය ..........................................දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති බවද,
4. ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවද,
5. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරණ තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

දිනය .......................................... ..........................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : ..........................................................................................
තනතුර : ..............................................................................................................................................
ලිපිනය : ..............................................................................................................................................

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම – 2023 (සීමිත)

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පහත සුදුසුකම් ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** වැටුප් පරිමාණය

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.පරි.ච.03/2016 අනුව රු. 34605 – 10 x 660-11x755-15x930-63460/- වේ. වැටුප් කේත අංකය MN5-2016 වේ.

**03.** සේවා කොන්දේසි

අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

**04.** පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්

පරිවාස නිලධාරී II ශ්‍රේණියේ පුරප්පාඩු 02 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2023.12.10** දින වේ. තනතුරට බඳවා ගැනීම සඳහා අයශ්‍ය සියළු සුදුසුකම් **2023.12.10** දින හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**05.** සුදුසුකම්

5.1. අධ්‍යාපන සුදුසුකම්

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව, ජන සන්නිවේදන විද්‍යාව, සිංහල, අපරාධ විද්‍යාව, සමාජ වැඩ, මනෝ විද්‍යාව, මානව විද්‍යාව, ජීව විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ අධ්‍යයනය, සංවර්ධන අධ්‍යාපනය, ජනගහන විද්‍යාව, සාමය හා ගැටුම් නිරාකරණය යන විෂයයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුලත්ව සාමාන්‍ය/විශේෂ උපාධියක් ලබා තිබීම.

5.2. පොදු සුදුසුකම්

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii. සෑම අපේක්ෂකයෙකුම පූර්වාසන්න වසර 05ක කාල සීමාව තුල විනය ක්‍රියා මාර්ගයකට ලක් නොවී සිටිය යුතුය.
iv. අයදුම්කරු බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**06.** පළපුරුද්ද

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ MN 5-2016 (රා.පරි.ච.03/2016 අනුව) වැටුප් පරිමාණය ලබන හෝ ඊට පහළ මට්ටමකට අදාළ තනතුරක අවම වශයෙන් වසර 03 කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබීම හා අදාළ තනතුරේ සේවය ස්ථිර කර තිබීම.

**07.** වයස් සීමාව

අවම වයස් සීමාව අවුරුදු 24 යි. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු වූවන් බැවින් උපරිම වයස් සීමාව අදාල නොවේ.

07. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්ණ පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගයතා පරික්ෂණය | පැය 01 | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | පැය 02 | 100 | 40% |

08. විභාගය සඳහා විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. අභියෝගයතා පරික්ෂණය | භාෂා හැකියාව,තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරික්ෂා කිරීම සඳහා සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. |
| 2. සාමාන්‍ය දැනීම | ආර්ථික, දේශපාලන, අධ්‍යාපන, සංස්කෘතික, විද්‍යාත්මක ක්‍රීඩා ක්ෂේත්‍රයන්හි දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් සමන්විත වේ. |

09. විභාග ගාස්තු

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.1200/- කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

10. අයදුම් කිරීමේ ක්‍රමය

(අ) සියළුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා අයදුම්පත යොමු කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍රය භාගත කිරීම සිදුකළ හැකිය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය **2023.12.13** වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය-2023"** යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, ප්‍රධාන ලේකම් (බ.ප) / අමාත්‍යාංශ ලේකම් මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

(ඇ) අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අනිවාර්යයෙන් ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

**11. විභාගයට ඇතුල්වීම:**

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නිතීරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

**12. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

**13. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:**

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

**14. විභාග ක්‍රමය:**

i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
ii) මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

**15. බඳවා ගැනීමේ ක්‍රමය**

(අ) මෙම තනතුර සඳහා සුදුසුකම් ලත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

(ආ) ඉහත 15(අ) හිදී පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයදුම්පත් ලැබුණහොත් ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව අදාල පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

(ඇ) සුදුසුකම් ලැබීම සඳහා අවම වශයෙන් එක් එක් ප්‍රශ්ණ පත්‍රයකට ලකුණු 40% ක් බැගින් ලබා ගත යුතුය.සමාන ලකුණු ලබා ඇති අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සිටීනම් සුදුස්සෙකු/සුදුස්සන් තෝරා ගැනීමේ තිරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

**16.** මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

**17.** මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන ඕනෑම කරුණක් පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2023.11.29

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පරිපාලන හා ප්‍රමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී (II වන ශ්‍රේණිය) තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම - 2023 (සීමිත)

විභාග අංකය [ ]

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

01 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -..........................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් න්):

..........................................................

(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-..........................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | | | | ]

02 2.1 දැනට දරණ තනතුර : ..........................................................
2.2 එම තනතුර ස්ථිරද, තාවකාලිකද, අනියම්ද යන්න : ..........................................................
2.3 එම තනතුරට පත්වීමේ දිනය : ..........................................................
2.4 සේවය ස්ථිර කල දිනය : ..........................................................
2.5 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 ක කාලසීමාව තුළ විනය ක්‍රියා මාර්ගයට ලක් වී තිබේද? ..........................................................
2.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය : ..........................................................
2.7 සේවා ස්ථානයේ නම සහ ලිපිනය : ..........................................................

..........................................................

03 3.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..........................................................

..........................................................

3.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්): ..........................................................

..........................................................

3.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:

i. සිංහලෙන්/දෙමළෙන්- ..........................................................

..........................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින්- ..........................................................

..........................................................

3.4 දුරකථන අංකය :

ස්ථාවර- [ | | | | | | | | | ] ජංගම- [ | | | | | | | | | ]

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

04 4.1 ස්ත්‍රී/පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී [ ] පුරුෂ [ ]

05 5.1 විවාහක/අවිවාහක බව - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

5.2 උපන් දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

5.3 වයස අවුරුදු: ☐☐ මාස: ☐☐ දින: ☐☐

06 අධ්‍යාපන සුදුසුකම් (අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 05 යටතේ)

1. උපාධිය පිළිබඳ :
(උපාධි සහතිකයේ හා විෂය විස්තර ලිපියේ පිටපත් ඇමිණිය යුතුයි)

i. ලබා ඇති උපාධිය : ..............................................................................................................

ii. උපාධියේදී හදාරණ ලද විෂයයන් : ..............................................................................................................

iii. විශ්ව විද්‍යාලයේ නම : ..............................................................................................................

iv. උපාධි සහතිකය වලංගු දිනය : ..............................................................................................................

07 2023.11. දිනට පූර්වාසන්න වසර 05 තුළ අදාළ තනතුරේ,

i. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ..............................................................................................................

ii. වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ..............................................................................................................

iii. සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? ..............................................................................................................

iv. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර තිබේද?
..............................................................................................................

v. ඉහත iv සඳහා පිළිතුර "ඔව්" නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න..............................................................................................................
..............................................................................................................

08 **ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය -** ..............................................................................................................

**විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය -** ..............................................................................................................

දිනය - ..............................................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න |
|---|

09 <u>අයදුම්කරුගේ සහතිකය</u>

..............................................................................................................
..............................................................................................................
.............................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී II ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයාකූල කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය ..............................

..............................................
අයදුම්කරුගේ අත්සන

**10** ආයතන ප්‍රධානියාගේ සහතිකය
( අනාවශ්‍ය වචන කපා හරින්න)

............................................................ මහතා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ........................... දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ................................ තනතුරක සේවය කරන බවත්............................ දින සිට සේවය ස්ථිර කර ඇති/නැති බවත් එම තනතුරේ ..............දිනට වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නොමැති බවත් , පූර්වාසන්න වසර 05 තුල සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නොමැති බවත් , වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති/ඇති බවත් සහතික කරමි සහතික කරමි.

2. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බවත්, නියමිත මුදල ගෙවා ලදුපත අලවා ඇති බවත් සහතික කරන අතර අදාල බඳවා ගැනීමේ පරිපාටිය අනුව මෙම නිලධාරියා/ නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය ................................ ...........................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**11.** දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

**බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් 2020.11.18 දින අනුමත කර ඇති බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරී තනතුරට බඳවා ගැනීමේ පටිපාටියේ 7.3 වගන්තිය අනුව ............................................ මහතා/මිය/මෙනවිය සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.**

දිනය .................................... ...........................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

**12.** ප්‍රධාන ලේකම් (බ.ප) / අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය

ඉහත අයදුම්පත නිර්දේශ කරමි.

දිනය .................................... ...........................................................................

ප්‍රධාන ලේකම්(බ.ප)/අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ

අත්සන හා නිල මුද්‍රාව

**බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ 111 ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම -2023 (සීමිත)**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් පරිමාණය
මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච 03/2016 අනුව රු.47,615-10x1,335-8x1,630-17x2,170-110,895/ -වේ. වැටුප් කේත අංකය SL 01-2016 වේ.

03. සේවා කොන්දේසි
මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදි ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතුය. අනුමත සේවා ව්‍යවස්ථාව සහ රජය විසින් පනවනු ලබන සේවා කොන්දේසි වලටද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති හා මූල්‍ය රෙගුලාසි වලටද යටත් වේ.

04. **පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන්**
**මෙම තනතුර සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.**

4.1 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය **2023.12.10** දින වේ. අයදුම් කරන තනතුරට අදාල සියලු සුදුසුකම් **2023.12.10** දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි.

05. **බඳවා ගැනිමට අදාළ සුදුසුකම්**

5.1 පළපුරුද්ද

5.1.1 (අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 1 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

හෝ

5.1.2 (අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

සහ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරිමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය /පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම

සහ

(ඇ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

හෝ

5.1.3 (අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

සහ

(ආ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරිමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම (මෙහිදි සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතුය)

සහ

(ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරිමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

සහ

(ඈ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

හෝ

5.1.4 (අ) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පන්තියේ 11 ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම

සහ

(ආ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක වශයෙන් ජාතික වෘත්තිය කුසලතා (NVQ) හෝ (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම

සහ

(ඇ) එම ශ්‍රේණියට නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම

❖ සටහන - ඉහත ඡේද අංක 5.1 පළපුරුද්ද යටතේ සඳහන් කර ඇති 5.1.1, 5.1.2, 5.1.3 හා 5.1.4 යන අතරින් එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

**5.2** කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකු බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**5.3** පහත සඳහන් පරිදි වෙනත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය:

අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

ආ) අයදුම්කරු යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

ඇ) සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත ඡේද අංක 05 හි සඳහන් සුදුසුකම් ........................ දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි

## 06. විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1.සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 02 | 100 | 40 |

සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරඟ විභාගයක් වුවද එක් එක් විෂය සඳහා වෙන්කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% බැගින්වත් අපේක්ෂකයන් විසින් ලබාගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිළි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

## 07. විභාගය සඳහා විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කර ගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්ෂකයාට යොමු කර අපේක්ෂකයාට සතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම, නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව, ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා බස්නාහිර පළාත් මුල්‍ය රීතිවලට අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

08. විභාග ගාස්තු :

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු.1200/- කි. (ඉල්ලුම් කරනු ලබන සෑම තනතුරක් සඳහාම අනුව වෙන වෙනම විභාග ගාස්තු ගෙවිය යුතුය). එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20 03 02 99 යටතේ පහත ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

09. අයදුම්කිරීමේ ක්‍රමය:

(අ) සියළුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා අයදුම්පත යොමු කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍රය භාගත කිරීම සිදුකළ හැකිය. අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(ආ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2023.12.13 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජන ජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ " බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය-2023" යන්න පැහැදිලි ලෙස සඳහන් කර තම ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට, බලයලත් නිලධාරියෙකු මඟින් ඔවුන්ගේ නිර්දේශ සහිතව එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඇ) අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 07 ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර් නම, ලිපිනය, ජාතිකහැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

10. විභාගයට ඇතුල්වීම:

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත සුදුසුකම් සපුරා ඇතැයි සලකා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත.

11. අපේක්ෂකයාගේ අනන්‍යතාවය:

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම:

අපේක්ෂකයෙකුට සුදුසුකම නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය ස හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ , විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවු නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සෙ කිරීමට ඉඩ ඇත. මෙ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්ති කටයුතු කරනු ලැබේ.

13. විභාග ක්‍රමය:

i. මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
ii. අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.
iii. මෙම විභාගය දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

14. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

15. මෙම අයදුම්පත් කැඳවීමෙ නිවේදනයෙන් අනාවරණය වන/නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

16. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරඟ විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

17. මෙම ගැසට් නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ..

18. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත
2023.11.29

## ආදර්ශ අයදුම්පත්‍රය

## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 1 පන්තියේ III ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීමේ (සීමිත) තරඟ විභාගය -2023

විභාග අංකය ☐
(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

☐

**1.0** 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -.......................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):
.......................................................................................................
(උදා: H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන්)-.......................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

**2.0** 2.1 ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි කැපිටල් අකුරින්): .......................................................
.......................................................................................................

2.2 ස්ථිර ලිපිනය(සිංහලෙන්/දෙමළෙන්):.......................................................
.......................................................................................................

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය:
i . සිංහලෙන්/දෙමළෙන්-.......................................................
.......................................................................................................
i i .ඉංග්‍රීසි කැපිටල් අකුරින්-.......................................................
.......................................................................................................

2.4 දුරකථන අංකය-.......................................................

ස්ථාවර: ☐☐☐☐☐☐☐☐☐☐ ජංගම: ☐☐☐☐☐☐☐☐☐☐

**3.0** 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය -(අදාළ අංකය කොටුව තුළ "√" ලකුණ යොදන්න)

ස්ත්‍රී ☐ පුරුෂ ☐

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය-.......................................................

**4.0** 4.1 විවාහක/අවිවාහක බව (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න)

විවාහක ☐ අවිවාහක ☐

4.2 උපන් දිනය වර්ෂය: ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

4.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු: ☐☐ මාස: ☐☐ දින: ☐☐

**5.0** අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 05 යටතේ ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව :

i. උපාධි සහතිකය - ......................................................................................................

ii. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව - ......................................................................................

iii. ජාතික වෘත්තිය කුසලතා (NVQ) ප්‍රවීණතාවය - ............................................................

iv. නිකුත් කල ආයතනය - ...............................................................................................

v. එම සහතිකය වලංගු දිනය - ........................................................................................

**6.0** සේවා තොරතුරු,

i. 2 පන්තියේ I ශ්‍රේණියට පත් වූ දිනය - ........................................................................
එම ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය- ..................................................

ii. 2 පන්තියේ I I ශ්‍රේණියට පත් වූ දිනය - .....................................................................
එම ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩ ඉම සමත් වූ දිනය - ................................................

iii. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අදාළ තනතුරේ සේවා කාලය- අවු - ....... මාස- ...... දින - ......

iv. බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කල දිනය - ..................................................

**7.0** 2023.12.10 දිනට පූර්වාසන්න වසර 05 තුළ අදාළ තනතුරේ,

i. සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද? ........................................................................

ii. වැටුප් රහිත නිවාඩු/වැටුප් රහිත විදේශ නිවාඩු ලබා තිබේද? ..................................................

iii. සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබේද? .........................................................

iv. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද?, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර තිබේද? .......................................................................................................................

**8.0** ලදුපත් ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..........................................................

විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය - .......................................................................................

දිනය - ..............................................................................................................................

| ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න |
|---|

## 9.0 අයදුම්කරුගේ සහතිකය:

(අ) මෙම අයදුම් පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමේ සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, අදාළ තනතුර සඳහා පත්කරනු ලැබීමට නුසුදුස්සෙකු වන බවත් ඒ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කිරිමට යටත් වන බවද මම දනිමි.

(ඇ) තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

(ඈ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

දිනය .............................  .......................................................

අයදුම්කරුගේ අත්සන

## 10.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය

( අනවශ්‍ය වචන කපා හරින්න)

…........................................................... මහතා/මිය/මෙනවියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ….......................... දින සිට 2 පන්තියේ 1/11 ශ්‍රේණියේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නිළධාරියෙකු වශයෙන් සේවය කරන බවත්, එම තනතුරේ ...............දිනට වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති/නොමැති බවත්, පූර්වාසන්න වසර 05 තුල සියලු වැටුප් වර්ධක උපයාගෙන ඇති/නොමැති බවත්, වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇති/නැති බවත්, ඔහුට /ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති/ඇති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති/ඇති බවත් සහතික කරමි.

2. අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති විස්තර නිවැරදි බව සහතික කරන අතර අදාල සේවා ව්‍යවස්ථාව අනුව මෙම නිලධාරියා/ නිලධාරිනිය සුදුසුකම් සපුරා ඇති බව ද නිර්දේශ කරමි.

දිනය .................................  ..................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

## 12.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කර ඇති බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව..................................... මහතා/මිය/මෙනවිය සුදුසුකම් සපුරා ඇති බැවින් අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ......…...........................  .......…..............................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

## 13.0 අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ නිර්දේශය

ඉහත අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ..................................

...............................................................................

අමාත්‍යාංශ ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව

## 14.0 ප්‍රධාන ලේකම් (බ.ප) ගේ නිර්දේශය

ඉහත අයදුම්පත නිර්දේශ කරමි.

දිනය ......................................

..........................................................................

ප්‍රධාන ලේකම් (බ.ප) ගේ අත්සන හා නිල මුද්‍රාව